මගේ අංකය : JSC/SEC/CIR Letter/2021

සියලුම මහාධිකරණ විනිශ්චයකාරවරුන් සහ සියලුම අධිකරණ නිළධාරීන් වෙත,

<u>**බන්ධනාගාර ජනගහනය ඉහලයාම හා කොවිඩ් ව්‍යාප්තිය පාලනය කිරීම.**</u>

ශීර්ෂගත කරුණට අදාළව අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් එම්.එම්.පී.කේ.මායාදුන්නෙ මහතාගේ සමාංක MOJ/SEC/02/03 හා 2021.08.16 දිනැති ලිපිය (ඇමුණුම 01) හා ඒ සමගින් මා වෙත යොමු කර ඇති නීතිපතිතුමාගේ අංක AG/42/2012 හා 2021.08.13 දිනැති ලිපියද (ඇමුණුම 02) බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු අමාත්‍යාංශයේ ලේකම් මේජර් ජෙනරාල් (විශ්‍රාමික) වී.ආර්.සිල්වා මහතාගේ අංක SMPRPR/Sec/23 හා 2021.08.13 දිනැති ලිපිය (ඇමුණුම 03) හා බන්ධනාගාර කොමසාරිස් ජනරාල් එච්.එම්.ටී.එන්.උපුල්දෙනිය මහතාගේ අංක කේ08/විවිධ/2021 හා 2021.08.13 දිනැති ලිපිය (ඇමුණුම 04) යන ලිපි පිළිබඳව සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව, එම ලිපිවල පිටපත් ඔබගේ දැනගැනීම සඳහා ඔබ වෙත යොමු කිරීමට මට නියම කර ඇත.

02. අදාල ලිපිවල පිටපත් මේ සමඟ අමුණා ඇත.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච්.එස්.සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2021 අගෝස්තු මස 18 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදීය.

පිටපත : එම්.එම්.පී.කේ.මායාදුන්නෙ මහතා, ලේකම්, අධිකරණ අමාත්‍යාංශය , කොළඹ 12- දැ.ගැ.ස

ඇමුණුම 01


ලේකම්
செயலாளர்
Secretary

දුරකථනය
தொலைபேசி
Telephone
2449959

ෆැක්ස් අංකය
பெக்ஸ் இல.
Fax No.
2445447

E-Mail: secretary@moj.gov.lk

ප්‍රධාන කාර්යාලය
பொது அலுவலகம்
General Office

දුරකථනය
தொலைபேசி
Telephone
2323022

ෆැක්ස් අංකය
பெக்ஸ் இல.
Fax No.
2320785

Web Site: www.moj.gov.lk


අධිකරණ අමාත්‍යාංශය

நீதி அமைச்சு

MINISTRY OF JUSTICE


අධිකරණ ලේකම්
நீதிச்செயலாளர்
Secminjust

555

info@moj.gov.lk

ශ්‍රේෂ්ඨාධිකරණ සංකීර්ණය
කොළඹ 12
மீயுயர் நீதிமன்ற கட்டிடத்தொகுதி
கொழும்பு 12
Superior Courts Complex,
Colombo 12.


JUDICIAL SERVICE COMMISSION SECRETARIAT
16 AUG 2021

මගේ අංකය / எனது இல / My No. MOJ/SEC/02/03

ඔබේ අංකය / உமது. இல. / Your No.

දිනය / திகதி / Date 2021.08.16

ලේකම්

අධිකරණ සේවා කොමිෂන් සභාව

<u>හදිසි අවධානයට</u>

<u>බන්ධනාගාර වල රිමාන්ඩ් සිරකරුවන් ඉහළ යාම.</u>

නැවත වතාවක් බන්ධනාගාරවල රිමාන්ඩ් සිරකරුවන් ඉහළ යාම හා COVID 19 රෝගයේ පැතිරයාම නිසා උද්ගත වී ඇති තත්ත්වය යටතේ ගරු නීතිපතිතුමන් විසින් පොලිස්පතිවරයා වෙත අංක AG/42/2012 හා 2021.08.13 දිනැතිව නිකුත් කරන උපදෙස් වල පිටපතක් හා බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයාගේ අංක කේ08/විවිධ/2021 හා 2021.08.13 ලිපියේ පිටපතක් මේ සමඟ අමුණා එවමි.

ඒ අනුව, ගරු නීතිපතිතුමාගේ නිර්දේශ සැලකිල්ලට ගෙන අධිකරණ විනිසුරුවරුන් වෙත අවශ්‍ය උපදෙස් කඩිනමින් ලබාදීමට අවශ්‍ය කටයුතු යොදන මෙන් කාරුණිකව ඉල්ලමි.

එම්.එම්.පී.කේ.මායාදුන්නෙ
ලේකම්
අධිකරණ අමාත්‍යාංශය

ඇමුණුම 02

[redacted] ඉල. No. }

මබේ අංකය
ඉ.මනු. இல.
Your No. }

AG/42/2012

නීතිපති දෙපාර්තමේන්තුව
சட்டமா அதிபர் திணைக்களம்
**ATTORNEY - GENERAL'S DEPARTMENT**

තැ. පෙ. අංකය
அஞ்சல் பெட்டி
P.O. Box No. } 502

කොළඹ 12.
கொழும்பு 12
Colombo 12.

දුරකථන අංක
தொலைபேசி இல.
Telephone Nos. } 2147888 2433967 2433769 2320800 2327919

ඉලෙක්ට්‍රොනික් තැපැල
மின் - அஞ்சல்
E-mail } administration@attorneygeneral.gov.lk

ෆැක්ස්
தொலைநகல்
Fax } 2436421

2021.08.13

චන්දන වික්‍රමරත්න මහතා,
පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

**<u>රිමාන්ඩ් බන්ධනාගාරවල පවතින අධික තදබදය සහ වර්තමාන 'COVID 19' වසංගත තත්ත්වය</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් නීතිපති වෙත යොමු කරන ලද 2012.08.13 දිනැති ලිපිය හා සබැඳේ.

දැනට බන්ධනාගාර දෙපාර්තමේන්තුව භාරයේ රැඳවියන් 20433 ක සංඛ්‍යාවක් රඳවා සිටිනු ලබන බවත්, එම සංඛ්‍යාව සාමාන්‍යයෙන් රැඳවිය හැකි සංඛ්‍යාව ඉක්මවණ ප්‍රතිශතය 173% ක පසුබිමක් තුළ කොවිඩ් වෛරසය බන්ධනාගාරය තුළ ව්‍යාප්තවීම පාලනය කිරීම සම්බන්ධයෙන් දැඩි ගැටළුකාරී තත්ත්වයක් ඇති බව වාර්තා කර තිබේ.

මේ වන විට රටේ 'COVID 19' උවදුර නිසා උද්ගත වී ඇති බැරෑරුම් තත්ත්වය සහ එම උවදුර මැඩලීම සම්බන්ධයෙන් මහජන සෞඛ්‍යයට අදාළව රජය විසින් නිකුත් කර ඇති අනතුරු ඇඟවීම් සහ වෛද්‍ය නිර්දේශයන් සළකා බැලීමේ දී ශ්‍රී ලංකාව පුරා පිහිටා තිබෙන බන්ධනාගාරයන් හි දැනට රඳවා ඇති රිමාන්ඩ් රැඳවියන්ගේ අධික තදබදය හේතුවෙන් මෙම වසංගත තත්ත්වය මගින් ඔවුන් කෙරෙහි ඇතිවිය හැකි අවදානම සහ අනතුර කෙරෙහි අවධානයට ලක් විය.

රට පුරා සීඝ්‍රයෙන් පැතිර යන කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ, බන්ධනාගාර තුළ රඳවා සිටින රැඳවියන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සම්බන්ධයෙන් වඩාත් ප්‍රායෝගික සහ සාධනීය පියවර ගැනීම මේ අවස්ථාවේ දී අනාවශ්‍ය වී ඇත.

හෙරොයින් මත්ද්‍රව්‍ය පානය සඳහා ඇබ්බැහි වූවන් සහ හෙරොයින් හි ශුද්ධ බර ග්‍රෑම් 0 අඩුවන මට්ටමේ දළ බර ප්‍රමාණයක් (රස පරීක්ෂක දෙපාර්තමේන්තු දත්ත - සාමාන්‍යයෙන් අත්අඩංගුවට ගන්නා හෙරොයින් ප්‍රමාණයෙන් ශුද්ධ හෙරොයින් අඩංගුව ඇත් 15% පමණ ප්‍රතිශතයක් වේ.) වන අවස්ථාවල දී 1984 අංක 13 දරන පනත මගින් සංශෝධිත විෂ වර්ග, අබිං සහ අන්තරාදායක ඖෂධ පනතේ 54A වගන්තිය යටතේ අධිකරණයට කරුණු වාර්තා නොකිරීම මෙහි මූඛ්‍ය පරමාර්ථය වන අතර, එකී පනතේ 78(5)(අ) වගන්තිය යටතේ කරුණු වාර්තා කිරීම මගින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් මෙම ප්‍රශ්නගත අවස්ථාවේ දී බන්ධනාගාර තුළට යොමු වීම වළක්වාලිය හැකි බව මාගේ මතයයි.

තවද විමර්ශනයේදී අනාවරණය වන කරුණු අනුව හෙරොයින් හි දළ බර ග්‍රෑම් 2 ත් ග්‍රෑම් 4 ත් අතර කාණ්ඩයේ සැකකරුවන්ට ඇප ලබාදීම සම්බන්ධයෙන් විරුද්ධ නොවන බවට අදාළ මහේස්ත්‍රාත් අධිකරණයන් දැනුවත් කළ යුතු බවටත් උපදෙස් දෙමි.

එමෙන්ම, දෙයාකාරයකින් එක් ආකාරයකට වසර 01 ක සිර දඬුවමකින් දඬුවම් කළ හැකි වැරදි සම්බන්ධයෙන් සැකකරුවන් මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරනු ලබන මුල් අවස්ථාවේදීම ඔවුන්ට ඇප ලබාදීමට විරුද්ධ වීම සඳහා සුවිශේෂ අවස්ථානුගත කරුණු නොමැත්තේනම්, ඇප ලබාදීමට විරුද්ධ නොවන බව අධිකරණයට වාර්තා කළ යුතු බවට මෙයින් තවදුරටත් උපදෙස් දෙමි.

අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 393(2) වගන්තිය යටතේ නීතිපති වෙත පැවරී ඇති බලතල අනුව පහත සඳහන් උපදෙස් අනුගමනය කරන ලෙසට ඔබට මෙයින් දැනුම් දෙමි.

01. <u>මත්ද්‍රව්‍ය හා සම්බන්ධ රිමාන්ඩ් රැඳවියන්ට අදාල උපදෙස්.</u>

අත්අඩංගුවට ගන්නා ලද හෙරොයින්වල ශුද්ධ බර ප්‍රමාණය ග්‍රෑම් 02 හෝ ඊට වැඩි අවස්ථාවන් වලට මෙම උපදෙස් අදාල නොවිය යුතුය.

1.1 <u>හෙරොයින් දළ බර ග්‍රෑම් 10 - 20 අතර</u>

අත් අඩංගුවට ගන්නා ලද හෙරොයින්වල දළ බර ප්‍රමාණය ග්‍රෑම් 10 - 20 අතර වන්නේ නම් එනම, රජයේ රස පරීක්ෂක වාර්තාව නිකුත් වී නොමැති අවස්ථාවකදී මාස 03 හෝ ඊට වැඩි කාලයක් රක්ෂිත බන්ධනාගාරගතව සිටින සැකකරුවන්.

1.2 <u>හෙරොයින් දළ බර ග්‍රෑම් 05 - 10 අතර</u>

රජයේ රස පරීක්ෂක වාර්තාව ලැබී නොමැති අවස්ථාවකදී මසකට වැඩි කාලයක් රක්ෂිත බන්ධනාගාරගතව සිටින සැකකරුවන්.

1.3 <u>හෙරොයින් දළ බර ග්‍රෑම් 05 ට අඩු</u>

රජයේ රස පරීක්ෂක වාර්තාව ලැබී නොමැති අවස්ථාවකදී බන්ධනාගාරගතව සිටින කාලසීමාව අදාල නැත.

1.4 <u>හෙරොයින් ශුද්ධ බර ග්‍රෑම් 01 - 02 අතර</u>

රක්ෂිත බන්ධනාගාරගතව සිටින කාලසීමාව මාස 03 කට වැඩි.

1.5 <u>හෙරොයින් ශුද්ධ බර ග්‍රෑම් 01 ට අඩු</u>

රක්ෂිත බන්ධනාගාරගතව සිටින කාලසීමාව මසකට වැඩි.

1.6 <u>කැනබීස් සැටයිවා එල් නොහොත් ගංජා</u>

| | | |
|---|---|---|
| කිලෝ 05 කට වැඩි | - | බන්ධනාගාරගතව සිටින කාලසීමාව මසකට වැඩි. |
| කිලෝ 05 කට අඩු | - | බන්ධනාගාරගතව සිටින කාලසීමාව අදාල නොවේ. |

ඉහත අවස්ථාවල දී සැකකරුවන්ට විරුද්ධව මේ වනවිටත් අදාල මහේස්ත්‍රාත් අධිකරණවලට කරුණු වාර්තා කර ඇත්තේ, 1984 අංක 13 දරණ පනතින් සංශෝධිත විෂ වර්ග අබිං සහ අන්තරාදායක ඖෂධ ආඥා පනතේ 54(අ) වගන්තිය යටතේ වුවත්, මෙම 'COVID 19' උවදුර පවතින තත්ත්වය යටතේ නඩු කටයුතු අවසන් කිරීමට ගත විය හැකි කාලපරාසය පිළිබඳව දැඩි අවිනිශ්චිතතාවයක් පැවතීම හේතුවෙන් හුදෙක් එකී සැකකරුවන්ට ඇප ලබාදීමේ කාර්යය සඳහා පමණක් අදාල මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කළ හැකි බවට මෙයින් උපදෙස් දෙමි.
එසේම ඉහත දක්වා ඇති කාණ්ඩයන්ට ගැනෙන සැකකරුවන් විෂයෙහි ඇප මත මුදාහැරීම සඳහා පහත සඳහන් <u>තත්ත්වයන්</u> නොපැවතිය යුතු ය.

(i) සැකකරු රක්ෂිත බන්ධනාගාරගත කර ඇති වරදට අදාලව මත්ද්‍රව්‍ය ජාවාරම සහ මුදල් විශුද්ධිකරණය වැනි වෙනත් බරපතල ගණයේ වරදවල් වලට සම්බන්ධ අයෙකුවීම.

(ii) මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් වන වරදවල්වල දී සන්තකයේ තබාගැනීම හා ජාවාරම් කිරීම සම්බන්ධයෙන් පෙර වැරදි තිබීම.

(iii) ලියාපදිංචි අපරාධකරුවකුවීම. (IRC)

පොලිස් ඇප මත නිදහස් කළ හැකි සැකකරුවන් සම්බන්ධයෙන් 'COVID 19' උවදුර පවතින තත්ත්වය යටතේ පොලිස් ඇප මත නිදහස් කිරීමට කටයුතු කරන ලෙසත්, මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරන සැකකරුවන් සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්තුමාගේ බලතල පාවිච්චි කරමින් ඇප ලබාදීමේ කාර්යය පහසු කිරීම සඳහා ඇපදීමට විරුද්ධවිය නොහැකි අවස්ථාවල දී ඇපදීමට විරුද්ධ නොවන ලෙසට කටයුතු කරන ලෙසත් වැඩිදුරටත් උපදෙස් දෙමි.

එසේම, ඉහත තත්ත්වයන් යටතේ ඇප මත මුදා හරිනු ලබන සැකකරුවන් සම්බන්ධයෙන් සමීප අධීක්ෂණයක් සැකකරුගේ නිත්‍ය පදිංචියට අදාල බලප්‍රදේශයෙහි පොලිස් ස්ථානාධිපතිවරයා විසින් සිදු කළ යුතු බවට මෙයින් වැඩිදුරටත් උපදෙස් දෙමි.

උක්ත කරුණ සම්බන්ධයෙන් වැඩිදුර උපදෙස් අවශ්‍ය වන්නේ නම්, නීතිපති දෙපාර්තමේන්තුව සමග සම්බන්ධවීමට පියවර ගන්නා ලෙසට තවදුරටත් උපදෙස් දෙමි.

චේතිය ගුණසේකර,
අතිරේක සොලිසිටර් ජනරාල්.

අත්/කළේ:- සංජේ රාජරත්නම්,
ජනාධිපති නීතිඥ,
නීතිපති.

පිටපත්: 01. ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභාව, කොළඹ 12.

02. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්, බන්ධනාගාර දෙපාර්තමේන්තුව, කොළඹ 08.-(ඔබේ අංකය: කෝ08/විවිධ/2021)

*ත/AG-42-2012-AUGUST*

ඇමුණුම 03

2883719

3690

725

2883726

ප්‍රධාන කාර්යාලය
பிரதான காரியாலயம்
General Office
2883926
2883927
2883928

ෆැක්ස්
தொலைநகல்
Fax
2883929

විද්‍යුත් තැපැල්
மின்னஞ்சல்
E-mail
info@mnedol.gov.lk

බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය
சிறைச்சாலைகள் முகாமைத்துவம் மற்றும் சிறைக்கைதிகள் புனர்வாழ்வு நடவடிக்கைகள் இராஜாங்க அமைச்சு
State Ministry of Prison Management and Prisoners Rehabilitation Affairs

40, බුත්ගමුව පාර,රාජගිරිය.
40, புத்கமுவ வீதி, இராஜகிரிய.
40,Buthgamuwa Road, Rajagiriya.

මගේ අංකය / எனது இல. / My No. SMPRPR/Sec/23

ඔබේ අංකය / உமது இல. / Your No

RECEIVED 13 AUG 2021 Sec... Ministry ...

දිනය / திகதி / Date 13.08. 2021

ලේකම්
අධිකරණ අමාත්‍යාංශය
උපරිමාධිකරණ සංකීර්ණය
කොළඹ 12

**බන්ධනාගාර ජනගහනය ඉහල යාම හා කොවිඩ් ව්‍යාප්තිය පාලනය කිරීම සම්බන්ධයෙනි**

ඉහත කරුණ සම්බන්ධයෙන් බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් යොමු කර ඇති අංක කේ08/විවිධ/2021 හා 2021.08.13 දිනැති ලිපිය මේ සමග ඔබ වෙත යොමු කරමි.

02. බන්ධනාගාර තුල මේ වන විට රඳවා සිටින කොවිඩ් ආසාධිත සිරකරුවන් හා සැකකරුවන් ප්‍රමාණයේ සීඝ්‍ර ඉහල යාමක් දක්නට ලැබෙන අතර නවක රැඳවියන් බන්ධනාගාර තුලට ඇතුලත් කිරීමට පෙර තාවකාලිකව රඳවා තබන මධ්‍යස්ථාන ඇතුළු සියළු නිරෝධායන මධ්‍යස්ථානවල සහ දිවයින පුරා පිහිටි ප්‍රතිකාර මධ්‍යස්ථාවල ධාරිතාවය මේ වන විට ඉක්මවා ගොස් ඇත.

03. එබැවින්, බන්ධනාගාරතුල පවතින වර්තමාන තත්වය පාලනය කිරීම සඳහා බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් ඉහත ලිපියේ 05 ඡේදය මගින් කර ඇති යෝජනා නිර්දේශ කර ඉදිරි කටයුතු සඳහා කාරුණිකව යොමු කරමි.

මේජර් ජෙනරාල් (විශ්‍රාමික) වී.ආර්. සිල්වා
ලේකම්
බන්ධනාගාර කළමනාකරණ හා
සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු අමාත්‍යාංශය

පිටපත - බන්ධනාගාර කොමසාරිස් ජනරාල් - කරු. දැ.ගැ.ස.

ඇමුණුම 04

# බන්ධනාගාර මූලස්ථානය
# சிறைச்சாலைத் தலைமையகம்
# PRISON HEADQUARTERS

150, බේස්ලයින් පාර, කොළඹ 09.  150, பேஸ்லைன் வீதி,கொழும்பு 09.  150, Baseline Road, Colombo-09.

| දුරකථන<br>தொலைபேசி<br>Telephones | කාර්යාලය<br>அலுவலகம்<br>Office | 2695204<br>4677177 | කොමසාරිස් ජනරාල්<br>ஆணையாளர் நாயகம்<br>Commissioner - General | 2691976 | කොමසාරිස්<br>ஆணையாளர்<br>Commissioner | 2695221<br>2692818 | ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | 2695206<br>4677180 |
|---|---|---|---|---|---|---|---|---|

| මගේ අංකය<br>எனது இல.<br>My No. | කේ08/විවිධ/2021 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2021.08.13 |
|---|---|---|---|---|---|

ලේකම්
අධිකරණ අමාත්‍යාංශය, උපරිමාධිකරණ සංකීර්ණය, කොළඹ 12,

ලේකම් මගින්,
බන්ධනාගාර කළමනාකරණ හා පුනරුත්ථාපන රාජ්‍ය අමාත්‍යාංශය,
බුත්ගමුව පාර, රාජගිරිය.

<u>බන්ධනාගාර ජනගහනය ඉහලයාම හා කොවිඩ් ව්‍යාප්තිය පාලනය කිරීම සම්බන්ධයෙනි.</u>

මේ වන විට දිවයින පුරා ඇති බන්ධනාගාර ආයතනවලට උසාවි මගින් ඇතුලත් කරනු ලබන රැඳවියන් නැවතවරක් වැඩිවීමේ ප්‍රවනතාවක් ඇතිවී තිබේ. 2021.08.12 වන දිනට බන්ධනාගාර දෙපාර්තමේන්තුව භාරයේ රැඳවියන් 20433ක සංඛ්‍යාවක් රඳවා සිටිනු ලබයි. එම සංඛ්‍යාව සාමාන්‍යයෙන් රැඳවිය හැකි සංඛ්‍යාව ඉක්මවන ප්‍රතිශතය 173% කි. එවැනි පසුබිමක් තුල කොවිඩ් වෛරසය බන්ධනාගාර තුල ව්‍යාප්ත වීම පාලනය කිරීම සම්බන්ධයෙන් දැඩි ගැටළුකාරී තත්වයන්ට මුහුණදීමට සිදුව ඇති බව කාරුණිකව වාර්ථා කරමි.

02. මේවන විට විශේෂයෙන් බන්ධනාගාර තුලට ඇතුලත් කරනු ලබන නවක රැදවින් බොහෝ දෙනෙකු කොවිඩ් ආසාධිතයන් ලෙස හදුනාගත හැකි අතර 2021.08.12 දින වන විටදිවයින පුරා ප්‍රතිකාර මධ්‍යස්ථාන වල ප්‍රතිකාර ලබමින් සිටින රැඳවියන් සංඛ්‍යාව 1255 ක් වේ.

03. බන්ධනාගාර වෙත පිටතින් ඇතුලත් කරනු ලබන නවක රැදවියන් මගින් බන්ධනාගාර තුලට කොඩිව් වෛරසය පැමිනීම පාලනය කිරීම සදහා,එම රැදවියන් වෙනම රඳවා තබා වෛද්‍ය පරීක්ෂාවකින් පසුව බන්ධනාගාර වෙත ඇතුලත් කරන තෙක්, තාවකාලිකව රඳවා තැබීමේ මධ්‍යස්ථාන වල දින 14 ක් නිරෝධායනය කරන අතර එම මධ්‍යස්ථාන ද මේ වන විට ධාරිතාව ඉක්මවා ඇත.

04. එසේම මේවන විට පැරණි බෝගම්බර, පල්ලන්සේන හා බූස්ස යන නිරෝධායන මධ්‍යස්ථාන වල සිටින නවක රැදවියන්ගෙන් හදුනාගත් කොවිඩ් ආසාධියන් යොමු කිරිමට ප්‍රමානවත් ප්‍රතිකාර මධ්‍යස්ථාන නොමැති වීමෙන් ගැටළු සහගත තත්ත්වයක් ඇති වී ඇත. එසේම මෙම තත්වය බන්ධනාගාර තුල නොසන්සුන් තත්ත්වයක් ඇතිවීමට ද හේතු විය හැකිය.

05.මේ තත්ත්වය තුල උසාවි මගින් ඉතා වැඩි පිරිසක් රක්ෂිත බන්ධනාගාරගත කිරිම බන්ධනාගාරතුල තදබදය මෙන්ම කොවිඩ් ව්‍යාප්තියද වැඩිවීමට හේතුවක් වී ඇත. එබැවින් මේ පිළිබදව කඩිනම් අවධානය යොමුකර අධිකරණසේවා කොමිෂන් සභාව, නිතිපති දෙපාර්තමේකන්තුව හා පොලිස් දෙපාර්තමේන්තුව දැනුවත් කර නවක ඇතුලත් කිරීම අවම කිරිමට පියවර ගැනීමත් ඇප ලබා දිය හැකි නේවාසිකයන් හට ඇප ලබා දිමට කටයුතු කිරිමත් සුදුසු බවට කාරුණිකව දන්වා සිටිමි.

එච්.එම්.ටී.එන් උපුල්දෙනිය
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

**එච්.එම්.ටී.එන්. උපුල්දෙනිය**
**බන්ධනාගාර කොමසාරිස් ජනරාල්**
පිටපත් **බන්ධනාගාර මූලස්ථානය,**
**කොළඹ 09.**

ජෙනරාල් කමල් ගුණරත්න මහතා - ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය,
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය.

මේජර් ජනරාල් ජගත් අල්විස් මහතා - ලේකම්, මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
සුහුරුපාය, බත්තරමුල්ල

සී.ඩී වික්‍රමරත්න මහතා - පොලිස්පති, පොලිස් මූලස්ථානය, කොළඹ 01

මේජර් ජනරාල් රුවන් කුලතුංග මහතා - ජාතික බුද්ධි ප්‍රධානී,
ආරක්ෂක අමාත්‍යාංශය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය.

මේජර් ජනරාල් සුරේෂ් සලේ මහතා - අධ්‍යක්ෂ, රාජ්‍ය බුද්ධි සේවාව

කාරුණික අවධානය යොමු කිරීම සඳහා හා අවශ්‍ය කටයුතු සඳහා